මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்லிக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පෙරදිග සංගීතය I | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 |
|---|---|---|

අංක 01 සිට 40 දක්වා සියලු ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

01. එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන රාගය වන්නේ

1. භෛරවි 2. යමන් 3. කාෆි 4. භූපාලි

02. "කවුරුදෝ අර කවුලුවෙන් '' යන සරල ගීතය නිර්මාණය සඳහා පාදක කොට ගත් රාගය වන්නේ

1. බිලාවල් 2. කාෆි 3. භෛරවි 4. භූපාලි

03. කෙහෙර්වා තාලයේ ඨේකාව දෙවරක් වාදනය කිරීමෙන් ලැබෙන මාත්‍රා ගණනට සමාන හින්දුස්ථානී තාලය වන්නේ

1. ත්‍රිතාලය 2. දාදරා 3. කෙහෙර්වා 4. දීප් චන්දි තාලය

04. බටහිර $^5/_8$ තාල රිද්මයට සමාන හින්දුස්ථානී තාලය වන්නේ

1. ජප් තාලය 2. දීප් චන්දි තාලය 3. බෙම්ටෝ 4. ත්‍රිතාලය

05. ශුද්ධ නිෂාදය විවාදී ස්වරයක් ලෙස යෙදෙන රාගයක් වන්නේ

1. භූපාලි 2. යමන් 3. බිලාවල් 4. කාෆි

06. ගගධප, ගරිස, යන ස්වර සංගතිය යෙදෙන රාගයකි.

1. බිලාවල් 2. භෛරවි 3. භූපාලි 4. කාෆි

07.පහතරට ශාන්තිකර්ම වලදී යොදා ගනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ.

1. දෙවොල් බෙරය 2. දවුල 3. ගැට බෙරය 4. තම්මැට්ටම

08. අබුද්දස්ස කෝලම නාට්‍යයේ නිෂ්පාදකවරයා වන්නේ

1. දයානන්ද ගුණවර්ධන 2. විජය නන්දසිරි
3. ජයසේකර අපොන්සු 4. ජනක් ප්‍රේමලාල්

09. නූතන ලෝකයේ සිම්ෆනි ඕකෙස්ට්‍රා සඳහා ප්‍රකට සංගීතඥයෙකි.

1. මොසාර්ට් 2. යානී 3. බීතෝවන් 4. බාත්

10. මොසාර්ට් නම් සිම්ෆනි රචකයා ගේ විශිෂ්ඨ සිම්ෆනියක් වන්නේ

1. පැස්ටෝරල් 2. කෝරල් 3. එරොයිකා 4. මැජික් ෆ්ලූට්

11. රාග ගායනයේදී අවසානයේ වේගයෙන් ගයන ස්වර කොටස හැඳින්වෙන නම වන්නේ

1. තානාලංකාර 2. ජලා 3. ආලාප 4. අන්තරා

12. සුවද පද්ම ඕලු ආදි යන ගීතය සඳහා භාවිතා කළයුතු තාල වාද්‍ය භාණ්ඩය

1. දවුල යි. 2. තබ්ලාව යි. 3. මද්දලය යි. 4. ඩෝලය යි.

13.බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයේදී වයලින් පවුලට අයත් භාණ්ඩ අයත් වන වර්ගය වන්නේ.

1. Wood wind 2. Brass wind 3. percussion 4. string

14. තිත් රූප දෙකකින් ගැයෙන වන්නමකි.

1. තිසරා 2. උකුසා 3. කෝකිල 4. නෛයඩි

15. ම ධ ස (F A C) යන ස්වර වලින් කියැවෙන Chord එක කුමක්ද

1. $B^b$ Major 2. F Major 3. C Major 4. D Minor

<u>ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.</u>

| A | B | C | D |
|---|---|---|---|
| වයලීනය | තබ්ලාව | එස්රාජය | සිතාරය |

16. හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය

1. A 2. B 3. C 4. D

17. පෙර අපරදිග දෙකෙහිමඑකසේ යොදා ගන්නනා භාණ්ඩයකි.

1. A 2. B 3. C 4. D

18. ස්වර සාධනය එක සමානව යෙදෙන භාණ්ඩ යුගල වන්නේ.

1. A සහ C 2. B සහ C 3. A සහ D 4. C සහ D

19. වාදනය සඳහා මිස්රාබය යොදා ගන්නා භාණ්ඩයකි.

1. C 2. A 3. D 4. B

20. B අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය වාදනය කිරීම සඳහා ලොව ප්‍රකට වාදකයෙකි.

1. රවි ශංකර් 2. හරි ප්‍රසාද් චෞරසියා 3. ජග්ජිත් සිං 4. ශකීර් හුසේන්

21. Harmony සංකල්පය හා නොගැලපෙන වැකිය වන්නේ.

1. ස්වර සුසංයෝග වීමයි

2. Chord මත Harmony සිද්ධාන්තය ගොඩනැගේ

3. Chord එකකට ස්වර 03 ක් අවශ්‍ය වුවද Harmony වීමට ස්වර 02 ක් වුවද සෑහේ.

4. Harmony සිද්ධාන්තය දේශීය සංගීතයට පමණක් යොදා ගැනේ

22.සමුද්‍ර ඝෝෂ වෘත්ත අනුව ගැයෙන ගී පාදයකි.

1. රෑ රැසේ අඳිනා ලෙසේ　　2. රගත් සුරා පිරූ විතින්

3. පැහැසරණිය මිණි පැමිණිය　　4. සඳවා සුදු වැලි පිවිතුරු

23. නලු ගීතිකා තාලය අනුව නිර්මාණය වූ වන්නමකි.

1. සබරගමු වන්නම්　2. උඩරට වන්නම්　3. පහතරට සිංදු වන්නම්　4. සවුදම්

24. ඩොටඩ් මිනිම් සංකේතයේ වටිනාකම මාත්‍රා

1. 2 කි.　2. 4 කි.　3. 1 කි.　4. 3 කි.

25. ගිටාරයේ තත් ගණන

1. 6 කි.　2. 4 කි.　3. 5 කි.　4. 12 කි.

වරහන් තුළ ඇති පිළිතුරු යොදා 26 සිට 30 දක්වා ප්‍රශ්නවල හිස් තැන් පුරවන්න.

( බීතෝවන්, කෙළි ගී, නෙලුම් ගී ,ඩබ්. බී. මකුලොලුව , ග්‍රැමෆෝන් ගී )

26. .......................................ශ්‍රී ලංකාවේ ජන සංගීතයේ උන්නතියට දායක වූ සංගීතඥයෙකි.

27. ඔළිඳ කෙළිය හා මේවර කෙළිය අයත් වන්නේ.................................වලටය.

28. දැඩි කළ මාතා ................................ගණයට අයත් වේ.

29. බිහිරිව සිටියදී සිම්ෆනියක් නිර්මාණය කළ සංගීතඥයා වන්නේ ........................................ය.

30. ......................................කාන්තාවන් මූලිකත්වය ගෙන සිදු කෙරෙන කාර්යයකදී ගයන ගී විශේෂයකි.

31. ස ස්වරය සඳහා Harmony වන ස්වර යුගලයකි

1. රි , ධ　2. ග , ම　3. ග, ප　4. නි , ම

32. තබ්ලා වාදනයේදී දෑතම උපයෝගී කර ගනිමින් උපදවනු ලබන අක්ෂර 02 ක් වන්නේ

1. ධිං , ධා　2. තිං , තා　3. කත් , තුං　4. කත් , තා

33. ගැල් පැල් පාරු ගී වර්ග ගැයෙනුයේ

1. අනාඝාතාත්මකවය.　2. සමග්‍රහයෙනි.　3. ආඝාතාත්මකවය.　4. විෂමග්‍රහයෙනි.

34. ජන සංගීතය ආශ්‍රය කරගෙන නිර්මාණය වූ සරල ගීතයකි.

1. සාදු දන්තදා.　　2. මල්සරා බැල්ම හෙලා.

3. අඳුර අඳුර මගේ .　　4. නිල් අහස් තලේ අගේ.

35. පරිගණක සංගීතයේදී භාවිතා කළ හැකි මෘදුකාංග යුගලයකි.

1. Jet audio – Windows media player　　2. Calk Walk - Nero

3. Strings – Fire Fox　　4. Nuendo - Reason

36 – 40 දක්වා ඇති සංකේත නම් කරන්න.

36.  ....................................

37.  ....................................

38.  ....................................

39. # ....................................

40. ((    )) ....................................

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පෙරදිග සංගීතය II | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 |
|---|---|---|

පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 ටපමණක් පිළිතුරු සපයන්න.

01. පහත i සිට xii දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. විකෘති ස්වර 02 ක් යෙදෙන සම්පූර්ණ ජාතියට අයත් රාගයක් නම් කරන්න.

ii. මුද්‍රප්පදය නමැති විශේෂ කොටසක් සහිත ගායනා විශේෂය කුමක්ද ?

iii. "සත් සියක් කපු මල් රැගෙන මම "  යන ගී පාදයට ගැලපෙන දේශීය තිත නම් කරන්න.

iv. සුවඳේ මට සීතල සුළඟ පවා යන ගීතය නිර්මාණය කොට ඇති ගී ගායනා ශෛලිය කුමක්ද ?

v. පහතරට ප්‍රධාන ගැමි නාට්‍ය විශේෂය කුමක්ද?

vi. ජන ගී වර්ගීකරණයේදී දරු නැළවිලි ගී අයත් වන්නේ ....................... . ගී ගණයටය.

vii. සංගීත භාණ්ඩයන්ගේ නාද එකිනෙකට වෙනස් වීමට බලපාන ගුණය.............................වේ.

viii. ලාංකීය කණ්ඩායම් සංගීතයේ පියා ලෙස ..................................හඳුන්වයි.

ix. එන්නද මැණිකේ මමත් දියඹටා යන ගීතය ....................... .........මහතා නිර්මාණය කළ අතර ඒ සඳහා ................................. සංගීතය ආභාෂය කරගෙන ඇත.

xi........................... හින්දි චිත්‍රපටයේ එන තු ගංගා කී මෞජ මේ යන ගීතය නිර්මාණය සඳහා ....................................රාගය ඇසුරු කරගෙන ඇත. (ල.1 x 12 )

02. නිර්දේශිත රාග03 ට අයත් ස්වර ඛණ්ඩ කිහිපයක් පහත දැක්වේ.

A. සරිග, පග, ධපගරිස.   B. නිරිග,රිග,රිස   C. ස,ගරිගප, ධනිසි

i. A B C හි දැක්වෙන ස්වර ඛණ්ඩ වලට අයත් රාග පිළිවෙලින් නම් කරන්න (ල.03 )

ii. එම රාග අතුරින් එක් රාගයකට අදාලව මාත්‍රා 08 ට නොඅඩු තානාලංකාර 02 ක් ලියන්න. (ල.03 )

iii. එම රාග අතුරින් දිනයේ ප්‍රථම ප්‍රහරයේ ගැයෙන රාගයෙහි මධ්‍ය ලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ල.03 )

iv. ඉහත මධ්‍යලය ගීතයට හෝ වාදිතයට අදාළ හින්දුස්ථානී තාලය තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල.03 )

03. නිර්දේශිත රාග 02 විස්තර පහත දැක්වේ.

A. "ම " ස්වරය වාදී වන අතර ස්වර 12 මහාවිතා කළ හැකිය.

B. පංචමය වාදී ස්වරය වන අතර සම්පූර්ණ ජාති රාගයකි.

i. A සහ B යන රාග නම් කරන්න. (ල.02 )

ii. B රාගයට අදාළව උච්ච සඞ්ජය දක්වා විහිදෙන ස්වර අභ්‍යාසයක් ගොඩ නගන්න. (ල.02 )

iii. ඉහත රාග අතුරින් සර්ව කෝමළ රාගයට අයත් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ල.06 )

iv.මේල 10 ක් මත රාග ජනිත වීම සිදු වී ඇත. එම මේල 10 න් බිලාවල්, කාෆි. භෛරවි, මේල හැර වෙනත් මේල 04 ක් නම් කරන්න. (ල.02 )

04. i. දී ඇති තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.04)

| මෙහෙ ගී | ඇදහිලි ගී | සමාජයීය ගී | සේ ගී |
|---|---|---|---|
| i. | ii. | iii. | iv. |
| v. | vi. | vii. | viii. |

( කලගෙඩි සෙල්ලම, තුන්සරණේ කවි, වන්නම්, පැල් ගී, ගැල් ගී, ප්‍රශස්ති, දරු නැළවිලි ගී, ශාන්තිකර්ම ගී )

ii. ඉහත ගී වර්ග අතුරින් ආඝාතාත්මක පැදියක පළමු පේළි 02 පද ප්‍රස්තාර කරන්න. (ල.04 )

iii. පහතරට සිංදු වන්නමක කොටස් නම් කරන්න.. (ල.02 )

iv. ශ්‍රී ලාංකීය ජන සංගීතයේ උන්නතියට දායක වූ සංගීතඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ල.02 )

05. i. නූර්ති හෝ නාඩගම් රංග ශෛලිය පිළිබඳව පහත කරුණු ඔස්සේ විස්තර කරන්න . (ල.06)

A. ආරම්භය හා ව්‍යාප්තිය. B. සංගීතමය ආභාෂය. C. යොදාගත් සංගීත භාණ්ඩ.

ii. ඔබ කැමති නූර්ති හෝ නාඩගම් ගීතයක ස්ථායි කොටස ප්‍රස්තාර ගත කරන්න. (ල.04 )

iii. නූර්ති හා නාඩගම් අතර වෙනස්කම් 02 ක් ලියන්න. (ල.02 )

06. /සරි ග - / ප -ග ස / + සග රි / ස නි ධ / ස - - / - - - /

i. ඉහත පෙරදිග ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ල.04)

ii.ඉහත ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න. (ල.04 )

iii.ඉහත ප්‍රස්තාරයේ තාලයට ගැලපෙන දේශීය තිත නම් කර බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල.02 )

iv.බටහිර සංගීතයේ හඬතල 04 නම් කරන්න. (ල.02 )

07. පහත සඳහන් සංගීතඥයින් තිදෙනෙකු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. රෝහණ බැද්දගේ.
2. රහුමාන්.
3. යානී.
4. ඩබ්. බී. මකුලොලුව
5. මොසාර්ට් (ල.04 x 3 = 12 )